# (ඇ) මිල, වැටුප් හා රැකී රක්ෂා

## මිල

ජීවන වියදමෙහි ඇති වන වෙනස්වීම් මැණීම සඳහා උපයෝගී කර ගනු ලබන්නේ සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ කම්කරු පංතියේ සාමාන්‍ය පවුලක අය-වැය අනුව සකස්කොට ඇති පාරිභෝගික මිල දශීකයයි. මේ දර්ශකයේ ශීර්ෂ බර තැබීම් සකස් වන්නේ 1953, 6 වැනි සැසි වාර්තාවේ නිර්දේශයනට අනුවය. පාරිභෝගික මිල දර්ශකයෙහි භාණ්ඩ අනුව සහ ගණ අනුව පසුගිය තෙමස තුළදී ඇති වූ වෙනස්වීම් පහත සටහනෙන් දැක් වෙයි.

සංඛ්‍යා සටහන II—23

**කොළඹ, පාරිභෝගික මිල දර්ශකය**

**(1952=100)**

| වර්ෂය | සියලුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර (61. 9%) | රෙදි පිළි ( 9· 4%) | ඉන්ධන සහ විදුලි එළිය (4.3 %) | ගෙවල් කුලී (5.7 %) | විවිධ (18. 7%) | දේශීය ගණය (51%) | ආනයන ගණය (44%) | අපනයන ගණය (5%) |
| 1959 | 105·2 | 104. 7 | 92. 1 | 102. 4 | 101. 5 | 115. 3 | 108. 0 | 97. 1 | 153. 1 |
| 1960 | 103. 5 | 100. 8 | 95. 1 | 102. 7 | 101. 5 | 117. 5 | 108. 9 | 93. 7 | 138. 4 |
| 1961 | 104. 8 | 99. 8 | 103. 9 | 104. 4 | 101. 5 | 122. 8 | 112. 3 | 94. 6 | 119. 1 |

සංඛ්‍යා— සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

දර්ශකයේ මාසික වෙනස්වීම පහත දැක්වේ.

සංඛ්‍යා සටහන II—24

**කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වෙනස්වීම්**

**1952 = 100**

| මාසය | සියලු ශීර්ෂ | | | ආනයන ගණය | | | දේශීය ගණය | | | අපනයන ගණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | වෙනස % | 1960 | 1961 | වෙනස % | 1960 | 1961 | වෙනස % | 1960 | 1961 | වෙනස % |
| ජනවාරි .. .. | 105·4 | 104·1 | —1·2 | 98·2 | 92·9 | —5·4 | 107·2 | 112·0 | +4·5 | 156·0 | 122·8 | —21·3 |
| පෙබරවාරි .. .. | 105·3 | 103·9 | —1·3 | 98·6 | 94·0 | —4·7 | 106·5 | 110·5 | +3·8 | 159·0 | 126·0 | —20·8 |
| මාර්තු .. .. | 105·6 | 103·3 | —2·2 | 98·5 | 92·0 | —6·6 | 107·3 | 111·3 | +3·7 | 155·8 | 123·2 | —20·9 |
| අප්‍රේල් .. .. | 104·0 | 103·9 | —0·1 | 93·6 | 93·6 | — | 108·7 | 111·0 | +2·1 | 151·1 | 123·4 | —18·3 |
| මැයි .. .. | 102·4 | 104·0 | +1·6 | 90·4 | 93·9 | +3·9 | 108·8 | 111·1 | +2·1 | 148·7 | 123·3 | —17·1 |
| ජුනි .. .. | 102·5 | 104·5 | +2·0 | 90·9 | 94·6 | +4·1 | 109·0 | 111·7 | +2·5 | 142·1 | 121·2 | —14·7 |
| ජුලි .. .. | 101·2 | 104·5 | +3·3 | 91·6 | 95·6 | +4·4 | 107·1 | 111·2 | +3·8 | 128·1 | 114·8 | —10·4 |
| අගෝස්තු .. .. | 100·7 | 105·4 | +4·7 | 91·8 | 96·5 | +5·1 | 106·6 | 112·3 | +5·3 | 121·7 | 113·2 | — 7·0 |
| සැප්තැම්බර් .. | 102·6 | 105·4 | +2·7 | 92·5 | 95·8 | +3·6 | 109·4 | 112·9 | +3·2 | 122·8 | 114·7 | — 6·6 |
| ඔක්තෝබර් .. | 103·2 | 105·9 | +2·6 | 91·9 | 95·6 | +4·0 | 111·2 | 113·8 | +2·2 | 123·1 | 116·8 | — 5·1 |
| නොවැම්බර් .. | 104·9 | 105·9 | +1·0 | 93·2 | 95·3 | +2·3 | 113·1 | 114·2 | +1·0 | 126·8 | 115·8 | — 8·7 |
| දෙසැම්බර් .. .. | 104·5 | 106·2 | +2·0 | 93·0 | 95·0 | +2·2 | 111·8 | 115·1 | +3·0 | 125·0 | 113·6 | — 9·1 |
| සාමාන්‍යය .. | 103·5 | 104·8 | +1·3 | 93·7 | 94·6 | +1·0 | 108·9 | 112·3 | +3·1 | 138·4 | 119·1 | —13·9 |

සංඛ්‍යා- ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් දැක්වෙන පරිදි සිල්ලර මිල මට්ටම 1960 මට්ටමට වඩා සාමාන්‍යයෙන් සියයට 1.3 කින් වැඩි විය. මෙයට හේතුවී ඇත්තේ දේශීය ගණය සියයට 3.1 කින්ද ආනයන ගණාය සියයට 1.0 කින්ද වැඩි වීමය. ආනයන ගණයෙහි මිල සියයට 14.0 කින් අඩු වූවද, ඉහත සඳහන් මිල වැඩිවීම නිසා ඒ මැකී ගියේය දර්ශකයට අපනයන ගණයේ ඇති වැදගත්කම සියයට 5 කි.

II – 23 වැනි සටහනෙහි ඇති සියලු භාණ්ඩ දර්ශකයන් සම්මිශ්‍රව පරීක්ෂා කිරීමෙන් 1960 වර්ෂයට වඩා 1961 දී ආහාර ද්‍රව්‍ය මිල සාමාන්‍යයෙන් සියයට 1 0 කින් අඩුවී ඇති බවත්, රෙදිපිළි ඉන්ධන හා විදුලිය හා විවිධ භාණ්ඩ දර්ශකයන් පිළිවෙලින් සියයට 9.3 කින්ද සියයට 1.7 කින් හා සියයට 4.5 කින්ද වැඩිවී ඇති බවත් හෙළි වෙයි රෙදිපිළි ගණයෙහි මිල විශාල ලෙස වැඩිවීමට හේතු වූයේ 1961 ජනවාරි 25 වැනිදින පනවන ලද රෙදිපිළි සඳහා තීරුබදු වැඩි කිරීමත් ගැල් කුලී සමග යාරයක මිල රු. 2 කට වැඩි රෙදි ගෙන්වීම සීමා කිරීමත් යන දෙවැදෑරුම් කරුණ හේතු කොට ගෙනය. ඉන්ධන හා විදුලිය ගණයේ මිල ඉහළ යාමට හේතුවූ ප්‍රධාන කරුණු වූයේ භූමිතෙල් ගැලුම සත 3 කින් වැඩි කිරීමත්, ගිනි පෙට්ටියක දේශීය භාණ්ඩ බද්ද සත $1\frac{1}{2}$ කින් වැඩි කිරීමත් ය 1961 ජූලි 27 වැනි දින විවිධ ගණයෙහි මිල වැඩිවීමට ප්‍රධානම හේතු වූයේ පිටරටින් ගෙන්වන දුම්කොළ රාත්තලක තීරු බද්ද රු. 8 50 කින් සහ මෙරට දුම්කොළ රාත්තලක බද්ද රු. 8 සිට රු. 28 දක්වා වැඩි කිරීමය.

නිපදවන ස්ථාන අනුව ආහාර ද්‍රව්‍ය වර්ගකර බැලීමේදී ඒ ඒ උප ගණවල මිල ගණන්හි පහත දැක්වෙන වෙනස්කම් හෙළි වෙයි

සංඛ්‍යා සටහන II—25

**පාරිභෝගික මිල දර්ශකයේ ආහාර උප ගණ පිළිබඳ මිල දර්ශකය**
**(1952 = 100)**

| වර්ෂය | සියලුම ආහාර වර්ග | දේශීය ආහාර වර්ග | අපනයන ආහාර වර්ග | ආනයන ආහාර වර්ග |
|---|---|---|---|---|
| 1959 .. .. | 104·7 | 104·4 | 153·1 | 97·0 |
| 1960 .. .. | 100·8 | 104·7 | 138·4 | 91·2 |
| 1961 .. .. | 99·8 | 110·6 | 119·1 | 87·2 |

සංඛ්‍යා:- සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

දේශීය ආහාර වර්ග සඳහා වූ මිල දර්ශකය පසුගිය අවුරුද්දට වඩා සියයට 5.6 කින් ඉහළ ගොස් ඇත. මෙයට හේතුවී ඇත්තේ අනෙකුත් හේතූන් සමග පැට්‍රෝල් බද්ද වැඩි කිරීම නිසා ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ ප්‍රවාහන (ගෙන යාම්-ඊම්) මිල වැඩිවීමය. පොල් මිල අඩුවීම නිසා අපනයන ආහාර ගණයෙහි මිල දර්ශකාය සිනයට 14.0 කින් පහළ වැටිණි.

ආනයන ආහාර ගණයෙහි මිල සියයට 4 4 කින් අඩු විය මෙයට හේතු වූයේ 1960 අප්‍රේල් මස සලාක හාල් සේරුවක මිල සත 35 සිට 25 දක්වා අඩු කිරීමේ බලපෑම 1961 මුලුල්ලේම පැවැතීමය. මේ මිල අඩුවීමත්, මූළුමනින්ම රජය විසින් ගෙන්වා විකුණන බඩුවල හැර පිටරටින් ගෙන්වන අනෙකුත් බඩු මිලෙහි සියයට 2.7 කින් ඇතිවූ පහළ වැටීමත් නිසා 1961 ජූලි 27 වැනි දින සුදු සීනි සහ පිටිවල මිල වැඩි කිරීම මැකී ගියේය. මෙදින සුදු සීනි මිල සත 62 සිට 67 දක්වාද පිටි මිල සත 23 සිට 28 දක්වාද වැඩි කරනු ලැබීය. එහෙත් 1961 දෙසැම්බර් 4 වැනි දින සුදු සීනි මිල පරණ පැවැති මිලටම අඩු කරන ලදී.

## වැටුප්

රජයේ සේවකයන්ගේ සහ රජයේ ගුරුවරුන්ගේ වැටුප් වෙනස්වීම් දක්වෙන දර්ශක අංක මාලාවක් මහ බැංකුව විසින් ගණනය කොට ඇත.* මේ දර්ශකයට, 1959 සැප්තැම්බර් 30 වැනි දිනට සිටි රජයේ සේවකයන්ගෙන් සියයට 95 කට වැඩි ගණනක් ඇතුළත් වෙයි. මෙයට රජයේ සේවකයන්ගෙන් සියයට 19.1 ක් වන රජයේ සියලුම නුපුහුණු සේවකයන්ද ගැනේ. 1953 සිට මේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණයන්හි සහ මූර්ත වැටුප් ප්‍රමාණයන්හි වෙනස්වීම් පහත සටහනෙන් දක්වේ.

සටහන II—26

**රජයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක**
**(1952 = 100)**

| කාල විච්ඡේදය | ලිපිකරු හා කාර්මික සේවකයෝ | | සුළු සේවකයෝ | | (අ) රජයේ සේවකයෝ | | රජයේ පාසල් ගුරුවරු | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් |
| 1953 | 101·0 | 99·5 | 102·1 | 100·5 | 101·6 | 100·0 | 101·0 | 99·4 |
| 1954 | 101·4 | 100·3 | 102·4 | 101·3 | 101·9 | 100·8 | 101 2 | 100·1 |
| 1955 | 106·9 | 106·4 | 110·4 | 109·9 | 108·7 | 108·2 | 110·2 | 109·7 |
| 1956 | 108·7 | 108·5 | 113·0 | 112·8 | 111·0 | 110·8 | 113·2 | 113·0 |
| 1957 | 111·2 | 108·2 | 116·0 | 112·8 | 113·8 | 110·7 | 113·9 | 110·8 |
| 1958 | 122·3 | 116·5 | 130·4 | 124·2 | 126·7 | 120·7 | 117·4 | 111·8 |
| 1959 | 122·3 | 116·3 | 130·4 | 124·0 | 126·7 | 120·4 | 117·4 | 111·6 |
| 1960 | 122·3 | 118·2 | 130·4 | 126·0 | 126·7 | 122·4 | 117·4 | 113·4 |
| 1961 | 122·3 | 116·7 | 130·4 | 124·4 | 126·7 | 120·9 | 117·4 | 112·0 |

සංඛ්‍යා – ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) ලිපිකරු හා කාර්මික සේවකයන් සහ සුළු සේවකයන්ගේ ඒකාබද්ධ දර්ශකය

1952 සිට ලිපිකරුවන්ගේ සහ කාර්මිකයන්ගේ වැටුප් ප්‍රමාණයන් සියයට 22.3 කින්ද සුළු සේවකයන්ගේ වැටුප් සියයට 30.4 කින්ද ඉහළ ගොස් ඇත. මේ නිසා රජයේ සේවකයන්ගේ ඒකාබද්ධ වැටුප් මිල දර්ශකය 126·7 ක් විය. (පාද වර්ෂය 1952 = 100) මේ කාලය තුළදී රජයේ ගුරුවරුන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 17 4 කින් ඉහළ ගියේය. මේ වැඩිවීම ප්‍රධාන වශයෙන් අවස්ථා දෙකකට ඇති විය. 1955 අප්‍රේල් මාසයේ රජයේ සියලුම සේවකයන්ගේ වැටුප් ප්‍රතිශෝධනය කරනලදී. අවිවාහක සේවකයන්ගේ ගෙවල් කුලී මූලික වැටුපෙන් සියයට 7 5 සිට 8·5 දක්වාද, විවාහක සේවකයන්ගේ ගෙවල් කුලී, මූලික වැටුපෙන් සියයට 15 සිට 17 දක්වාද වැඩි කරන ලදී. වැටුප් වැඩි කිරීමේ දෙවැනි අවස්ථාව වූයේ 1957 ඔක්තෝබර්, නොවැම්බර් අතරය. 1957 ඔක්තෝබර් මාසයේදී විෂමතා කොමිසමේ නිර්දේශවලට අනුව සේවකයන් සුළු කොටසකගේ වැටුප් වැඩි වන ලෙස ප්‍රතිශෝධනය කරන ලදී. 1957 නොවැම්බර් සිට අඩු වැටුප් ලබන පන්තියේ සේවකයන්ගේ විශේෂ ජීවන දීමනාව, සැලකිය යුතු ලෙස වැඩි කරන ලදී. මේ අනුව මෙතෙක් මාසයකට රු 5/ ක් ලැබූ සියලුම සේවකයනට විවාහක, අවිවාහක බේදයක් නොමැතිව රුපියල් 17.50 ක විශේෂ ජීවන වියදම් දීමනාවක් දෙන ලදී මේ කාලය තුළ දීම රු. 300 කට අඩු වැටුප් ලබන සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව මසකට රු. 5 කින් වැඩි කරන ලදී.

* මේ දර්ශකයන් ගණනය කිරීම පිළිබඳ සටහනෙක් මහ බැංකු විවරණිකාවේ පෙබරවාරි කලාපයේ දක්වා ඇත. දර්ශකයට ඇතුළත් නොවූ අය මණ්ඩලික තත්වයේ පරිපාලන, වෘත්තීයහා කාර්මික නිලධාරීහුය. වාර්ෂික වාර්තාවේ ii වැනි පරිච්ඡේදයේ 37 වැනි සංඛ්‍යා සටහන ද බලන්න.

වැටුප් ප්‍රමාණයන් වැඩිවීමත් සමග මූර්ත වැටුප් ප්‍රමාණදර්ශකයන් ද වැඩි විය. 1957 ඔක්තෝබර් මාසයෙන් පසු මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයන් උච්චාවචනයට ලක් වූයේ, ජීවන වියදමෙහි ඇතිවූ වෙනස්කම් නිසාය.

1961 දී මේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණයන්හි වෙනසෙක් ඇති නොවීය. එහෙත් ජීවන වියදම වැඩිවීම නිසා ඔවුන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණය සියයට 1·3 කින් අඩු විය.

පෞද්ගලික අංශයේ කම්කරු වැටුප් වෙනස්වීම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලැබී ඇත්තේ පඩි පාලක සභා යටතට ගෙන ඇති වෘත්තීන්හි නියුතු කම්කරුවන්ගේ පමණකි. පඩි පාලක සභා යටතට ගෙන ඇති වෘත්තීන්හි නියුතු කම්කරුවන්ගෙන් සියයට 89.4 ක්ම කෘෂිකාර්මික කම්කරුවෝය. පහත දැක්වෙන සටහනින් පඩිපාලක සභා යටතට ගෙන ඇති කම්කරුවන්ගේ වැටුප්වල 1953 සිට ඇතිවූ වෙනස්වීම් දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—27

**පඩි පාලක සභා යටතට ගැනෙන කර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක අංක.**

**(1952=100)**

| කාලච්ඡේදය | කෘෂිකර්මාන්තයෙහි නියුතු කම්කරුවන් | | කාර්මික හා වාණිජ සේවාවන්හි නියුතු කම්කරුවන් | | පඩිපාලක සභා යටතට ගැනෙන කර්මාන්තයන්හි නියුතු කම්කරුවන් | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය |
| 1953 | 101·5 | 99·0 | 101·0 | 99·4 | 101·5 | 99·9 |
| 1954 | 103·1 | 102·0 | 100·7 | 99·6 | 102·5 | 101·4 |
| 1955 | 106·6 | 106·1 | 101·4 | 101·0 | 105·9 | 105·4 |
| 1956 | 107·1 | 106·9 | 102·9 | 102·7 | 106·4 | 106·2 |
| 1957 | 108·7 | 105·6 | 104·5 | 101·5 | 107·8 | 104·7 |
| 1958 | 110·2 | 105·2 | 116·2 | 110·9 | 110·8 | 105·6 |
| 1959 | 110·2 | 104·8 | 123·8 | 122·4 | 112·3 | 106·7 |
| 1960 | 110·2 | 106·5 | 128·1 | 123·8 | 111·8 | 108·0 |
| 1961 | 110·7 | 105·6 | 128·4 | 122·5 | 112·3 | 107·2 |

සංඛ්‍යා - ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

පඩි පාලක සභා යටතට ගෙන ඇති කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණයන් 1961 දී සියයට 0.5 කින් වැඩි වී ඇත. මෙයට හේතු වූයේ විශෙෂ ජීවන වියදම් දීමනාව වැඩි කිරීම නිසා කෘෂිකර්මාන්තයේ නියුතු කම්කරුවන්ගේ වැටුප් සියයට 0.5 කින් ද කාර්මික හා වාණිජ සේවාවන්හි නියුතු අයගේ වැටුප් සියයට 0.2 කින් ද වැඩි වීම ය. එහෙත් වැඩි වූ දීමනාවලින්, වැඩි වූ ජීවන වියදම මැකී නොගිය නිසා ඔවුන්ගේ මූර්ත වැටුප් පිළිවෙළින් සියයට 0.8 කින් හා සියයට 1.1 කින් අඩුවිය.

## රැකී රක්ෂා

රටේ රැකියා ඇතියවුන්ගේ, අර්ධ රැකියා ඇතියවුන්ගේ සහ රැකියා නැතියවුන්ගේ ප්‍රමාණය ගැන සවිස්තර සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නොමැති දිවයිනේ රැකී රක්ෂා කාර්යාල 21 කේ ලියා පදිංචි වී ඇති ගණන රැකියා නැතියවුන්ගේ ප්‍රමාණයෙහි ඇති වන අඩු වැඩිවීම් සොයා ගැනීමේ දක්නය වශයෙන් භාවිතා කරනු ලැබේ. ලියා පදිංචි වන්නන්ගේ ප්‍රමාණයෙහි 1960 දී ඇති වූ වැඩිවීම 1961 මුල් මාස දෙකේ ද පැවැතිණි. එහෙත් වර්ෂයේ ඉතිරි කාලයේදී ඔවුන්ගේ ගණන මඳ වශයෙන් අඩුවිය 1960 දී රැකියාවන් සඳහා 1,51,092 ක් ලියා පදිංචි වී සිටි අතර, 1961 දී එය 1,51,265 ක් විය. වර්ෂය මුල දී සැම සේවක පංතියකම ලියා පදිංචිවූවන්ගේ ගණන වැඩි විය. ලියා පදිංචි වී සිටි පුහුණු සේවකයන්ගේ ගණන 1961 දෙසැම්බර් අවසාන වන විට 18,201 ක් විය මේ වැඩිවීමේ උපනතිය අවුරුද්ද මුළුල්ලේම පැවැති අතර, පසුගිය අවුරුද්දේ වැඩි වූ ප්‍රමාණයට වඩා 1961 දී වැඩිවීමේ ප්‍රමාණය සියයට 7. 5 ක් විය. කාර්මික හා ලිපිකරු වෘත්තීන් සඳහා ලියා පදිංචි වූ ගණන, 1961 දී 1960 දෙසැම්බරයට වඩා සියයට 5. 3 කින් වැඩි වී ඇති අතර, අර්ධ පුහුණු හා නුපුහුණු සේවක සංඛ්‍යාව සියයට 1. 9 කින් හා සියයට 2 5 කින් අඩු වී ඇත.

පසුගිය වර්ෂ කීපය තුළ රැකියා ලබා දී ඇති සංඛ්‍යාවන් එසේ ලබා ගත් සංඛ්‍යාව ලියා පදිංචි වී ඇති සංඛ්‍යාවෙන් සියයට කීයද යනුත් පහත එන සටහනින් දැක්වේ

සංඛ්‍යා සටහන II—28

### රැකියා ලබා දුන් සංඛ්‍යාව හා ලියා පදිංචි වී ඇති සංඛ්‍යාවට එහි ඇති සියයට ගණන.

| වර්ෂය | කාර්මික හා ලිපිකරු | % | පුහුණු | % | අර්ධ පුහුණු | % | නුපුහුණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1953 | 1528 | 18·2 | 669 | 10·4 | 1371 | 10·0 | 2820 | 12·2 | 6388 | 12·4 |
| 1954 | 1097 | 9·4 | 879 | 11·1 | 922 | 5·7 | 4660 | 17·0 | 7558 | 11·9 |
| 1955 | 2166 | 14·9 | 1064 | 12·5 | 1187 | 5·9 | 3791 | 13·6 | 8203 | 11·6 |
| 1956 | 1913 | 11·9 | 845 | 8·6 | 1565 | 6·1 | 4162 | 12·1 | 8485 | 9·9 |
| 1957 | 1176 | 6·3 | 709 | 5·3 | 1180 | 3·8 | 3053 | 6·4 | 6118 | 5·5 |
| 1958 | 1827 | 9·2 | 800 | 5·9 | 1006 | 3·1 | 2251 | 4·4 | 5384 | 5·0 |
| 1959 | 1667 | 8·0 | 1045 | 7·5 | 1275 | 3·8 | 3218 | 5·4 | 7205 | 5·6 |
| 1960 | 1400 | 5·3 | 771 | 4·6 | 1247 | 3·6 | 4744 | 6·5 | 8162 | 5·4 |
| 1961* | 1257 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2794 | 3·9 | 5648 | 3·7 |

සංඛ්‍යා - කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1961 දී රැකියා ලබා දී ඇති සංඛ්‍යාව ඊට පෙර වර්ෂයේ ලබා දී ඇති සංඛ්‍යාවට වඩා අඩුය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ රැකියා ලබා දෙන ලද නුපුහුණු කම්කරුවන්ගේ සංඛ්‍යාව අඩුවීමය. 1960 දී මෙම සංඛ්‍යාව 4,744 ක් වූ අතර 1961, 2794 තෙක් අඩුවිය. අනෙකුත් පංතිවල ලියා පදිංචි වූවනට ලබා දෙන ලද රැකියා ප්‍රමාණයද අඩු විය. ඒ ඒ පංතියේ ලියා පදිංචි වී ඇති සහ රැකියා ලබා දී ඇති සේවක සංඛ්‍යාව අතර ඇති සියයට ගණන ඉතාමත් අඩු, අර්ධ පුහුණු සේවක පංතියේය. මේ පංතියේ රැකියා ලබාගත් සංඛ්‍යාව ලියා පදිංචි වී ඇති සංඛ්‍යාවෙන් සියයට 2. 8 කි. මෙසේ සැම සේවක පංතියකම රැකියා ලබා දුන් අයගේ සියයට ගණන මෙයට පෙර වර්ෂයට වඩා අඩුය.

* තාවකාලිකයි.

## කම්කරු සම්බන්ධතා

වැඩ වර්ජන පිළිබඳ සංඛ්‍යා තොරතුරුවලින් සාමාන්‍යයෙන් කම්කරු පාලන සම්බන්ධතාවන්හි ඇති වන වෙනස්වීම් පිළිබිඹු වෙයි. වැඩ වර්ජන ගණන, ඊට සම්බන්ධ වූ කම්කරුවන්ගේ ගණන සහ වැඩ නැවැත්වීම්වල ප්‍රතිඵල වශයෙන් නැති වූ මිනිස් දවස් ගණන පහත දැක්වෙන සටහනෙන් පැහැදිලි වෙයි.

සංඛ්‍යා සටහන II—29

### වැඩ වර්ජන

| වර්ෂය | වැවිලි | | | වෙනත් රැකියාවන් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන ගණන | සම්බන්ධ වූ කම්කරුවන් | නැති වූ මිනිස් දවස් | වැඩවර්ජන ගණන | සම්බන්ධ වූ කම්කරුවන් | නැති වූ මිනිස් දවස් |
| 1958 .. | 123 | 39,372 | 3,40,632 | 96 | 42,713 | 3,99,228 |
| 1959 .. | 177 | 47,318 | 3,52,095 | 71 | 42,453 | 4,60,141 |
| 1960 .. | 123 | 42,528 | 2,59,948 | 37 | 4,839 | 15,139½ |
| 1961* .. | 89 | 24,864 | 3,15,491 | 38 | 21,758 | 1,15,248 |

සංඛ්‍යා – කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1961 දී වතුකරයේ ඇති වූ වැඩ වර්ජන ගණන, පසුගිය අවුරුද්දේ ඇති වූ වැඩ වර්ජන ගණනට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුය එහෙත් අනෙක් අංශවල ඇති වූ වැඩ වර්ජන ගණන ගිය අවුරුද්දට වඩා මඳක් පිරිහිණි. එසේ වුවද, වැඩ වර්ජන විශාල සංඛ්‍යාවක් ඇති වූයේ කම්කරු ජනතාවෙන් වැඩි කොටසක් වෘත්තීය සමිති යටතේ සංවිධානය වී ඇති වතුකරයේය. වතු කම්කරුවන්ගෙන් සියයට 64·6 ක් පමණ වෘත්තිය සමිතිවල සාමාජිකත්වය ලබා ගෙන සිටී. සියලුම වෘත්තීය සමිති සාමාජිකයන්ගෙන් සියයට 59·7 ක් පමණ වතු කම්කරුවෝ වෙති. 1961 දී වතුකරයේ වැඩ වර්ජන 89* ක් සහ අනෙකුත් වෘත්තීන්හි වැඩ වර්ජන 38* ක්ද ඇති විය. 1960 දී මෙය 123 ක් සහ 37 ක් විය. වැඩ වර්ජන වලට සහභාගි වූ වතු කම්කරු සංඛ්‍යාව පසුගිය අවුරුද්දේ සංඛ්‍යාවට වඩා අඩුය. අනෙකුත් වෘත්තීන්හි වැඩ වර්ජන ගණන පසුගිය අවුරුද්දේ සංඛ්‍යාවට කිට්ටු වුවද, සහභාගි වූ කම්කරු සංඛ්‍යාව පසුගිය අවුරුද්දට වඩා විශාලය. මෙහි විශේෂ ලක්ෂණයක් වූයේ වැඩ වර්ජන පවත්වා ගෙනගිය කාල සීමාව පසුගිය අවුරුද්දට වඩා වැඩිවීමෙන් පාඩු වූ මිනිස් දවස් ගණන සැලකිය යුතු ලෙස වැඩි වීමය. වතුකරයේ වැඩ වර්ජන පවත්වාගෙන ගිය සාමාන්‍ය දවස් ගණන 1960 දී 6·1 ක්වූ අතර 1961 දී එය දවස් 10·9* කට වැඩි විය. අනෙකුත් අංශවල වර්ජන පැවැති දිනක 3·1 සිට 10·9 කට වැඩි විය.

---

*තාවකාලිකයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ග කිරීම අනුව වතුකරයේ වැඩ වර්ජන වලින් සියයට 29·9* ක්ම වතු නීති, විනය සහ කාර්ය සංවිධානය ආදිය නිසා උද්ගත වී ඇති අතර, සියයට 12·6* ක් වැඩි වැටුප් සඳහා හෝ වැටුප් අර්බුද නිසා හෝ උද්ගත වූයේ විය. අනෙක් අංශවල ඇති වූ වැඩ වර්ජනවලින් සියයට 17·3* ක් සේවාවෙන් පහ කිරීම නිසා හෝ රැකියාව නැති වී යාම නිසා හෝ වූ අතර සියයට 4·7* ක් වැඩි වැටුප් සඳහා විය. මේ හේතුන්හි එකිනෙකට ඇති වැදගත් කම පසුගිය අවුරුද්දේ පිළිවෙළම අනුගමනය කෙළේය.

කෙසේ වුවද, මිනිස් දවස් වලින් වැඩි කොටසක් පාඩු වී ඇත්තේ සාමාන්‍ය ඉල්ලීම් නිසා උද්ගත වූ වැඩ වර්ජන හේතුකොට ගෙනය. මෙය පාඩු වූ මුළු මිනිස් දවස් ගණනින් සියයට 36·6* ක් විය. වැඩි වැටුප් ඉල්ලමින් කළ වැඩ වර්ජන නිසා පාඩු වූ මිනිස් දවස් ගණන සියයට 18 6* ක්වූ අතර, වැටුප් පමාවීම වැටුප් අත්තිකාරම් ආදිය නිසා කළ වර්ජනවලින් වූ පාඩුව සියයට 20·1* කි. වැඩි වැටුප් ඉල්ලමින් වැඩ වර්ජන බොහොමයක්ම කැරුනේ වතුකර නොවන අංශයේය. මේ නිසා පාඩු වූ මිනිස් දවස් ගණන, මේ අංශයේ පාඩු වූ මුළු මිනිස් දවස් ගණනින් සියයට 69·5* ක් විය. වැඩ වර්ජන පිළිබඳ සංඛ්‍යා තොරතුරු සටහන් කර ඇත්තේ වැඩ වර්ජන අවසාන වූ මාසයේදීය. එම නිසා 1961 දී පටන්ගෙන ඊළඟ අවුරුද්දේ අවසන් වූ වර්ජන නිසා පාඩු වූ මිනිස් දවස් මෙයට ඇතුළත් වී නොමැත

---

* තාවකාලිකයි.